# විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
## மின்வலு மற்றும் மீள்புத்தாக்க சக்தி அமைச்சு
## MINISTRY OF POWER & RENEWABLE ENERGY

අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.
இல. 72, ஆனந்த குமாரசுவாமி மாவத்தை, கொழும்பு 07.
No. 72, Ananda Coomaraswamy Mawatha, Colombo 07.

තැ.පෙ. / த.பெ. / P.O. Box 576


මගේ අංකය / எனது இல. / My Ref. No. PE/DEV/02/01/2012 V
ඔබේ අංකය / உமது இல. / Your Ref. No.
දිනය / திகதி / Date 2017.02.09

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති චක්‍රලේඛ අංක 2017/02

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

<u>බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය පිළිබඳ ජාතික වැඩසටහන</u>
<u>රාජ්‍ය ආයතන විසින් අනුගමනය කළ යුතු බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද</u>

<u>වායු සමීකරණ යන්ත්‍ර භාවිත කිරීමේදී අවධානය යොමුකල යුතු කරුණු</u>

බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය පිළිබඳ ජාතික වැඩසටහන යටතේ රාජ්‍ය ආයතන විසින් අනුගමනය කල යුතු බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද 2015.10.06 හා 2017.01.27 දිනැති චක්‍රලේඛ අංක SP/PCMD/6/2015 හි උපදෙස්වලට අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛ මගින් රාජ්‍ය ආයතනවල බලශක්ති සංරක්ෂණය හා කාර්යක්ෂම භාවිතය පිළිබඳව අනුගමනය කල යුතු ක්‍රමවේදයන් පිළිබඳව උපදෙස් නිකුත් කර ඇත .

2. ජනාධිපති ලේකම්ගේ ඉහත චක්‍රලේඛ උපදෙස් පරිදි සෑම රජයේ ආයතනයකම බලශක්ති සංරක්ෂණය හා කාර්යක්ෂම භාවිතය පිළිබඳව ක්‍රියා මාර්ග ගැනීමට බලශක්ති කළමනාකරුවකු පත් කිරීමට කටයුතු කල යුතු වේ. ඉහත චක්‍රලේඛ උපදෙස්වලට අනුව මෙතෙක් ඔබ ආයතනයේ බලශක්ති කළමනාකරුවකු පත් කර නොමැති නම් කඩිනමින් බලශක්ති කළමනාකරුවකු පත් කල යුතුය.

3. මෙම දිනවල ශ්‍රී ලංකාවට බලපා ඇති වියළි කාලගුණ තත්ත්වය හමුවේ විදුලිබල නිෂ්පාදනය සීමා වී ඇති බැවින් ඉහත චක්‍රලේඛයේ උපදෙස් සියළුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ විශේෂ අවධානයක් යොමු කර ක්‍රියාත්මක කල යුතු වේ. මෙහිදී රාජ්‍ය ආයතන බලශක්ති සංරක්ෂණ ක්‍රම උපරිම අයුරින් ක්‍රියාත්මක කර මහජනතාවට හා පෞද්ගලික අංශයට ආදර්ශමත් විය යුතුය.

4. රාජ්‍ය ආයතනවල විදුලි පරිභෝජනයෙන් 60% - 70%ක ප්‍රමාණයක් වායු සමීකරණ සඳහා වැය වන බව පෙනී ගොස් ඇත. මේ නිසා වායු සමීකරණ යන්ත්‍ර භාවිතය කාර්යක්ෂම කිරීමෙන් විශාල වශයෙන් විදුලිබලය ඉතිරි කර ගත හැක. එබැවින් සියළුම රාජ්‍ය ආයතන තම කාර්යාල ගොඩනැගිලිවල වායු සමීකරණ යන්ත්‍ර භාවිතා කිරීමේදී පහත සඳහන් උපදෙස් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කල යුතු වේ.

(අ) උදෑසන කාලයේදී හැකි සෑම විටම ජනෙල් විවෘත කර තබා බාහිර වාතාශ්‍රය ප්‍රයෝජනයට ගෙන, කාර්යාලය ආරම්භ කර පැයකට පමණ පසු වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කරන්න.

(ආ) වායු සමීකරණය කරන ලද කාමරයන් හි උෂ්ණත්වය 26°C හෝ ඊට වැඩි අගයක සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය 55% - 60% අතර තබා ගත යුතුය. කාමර උෂ්ණත්වය ඉක්මනින් පහත දැමීමෙ




විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය / மின்வலு மற்றும் மீள்புத்தாக்க சக்தி அமைச்சர் / Minister of Power & Renewable Energy 2574883 2574634
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍ය / மின்வலு மற்றும் மீள்புத்தாக்க சக்தி பிரதி அமைச்சர் / Deputy Minister of Power & Renewable Energy 2574735 3092520
ලේකම් / செயலாளர் / Secretary 2574918 2574744
කාර්යාලය / அலுவலகம் / Office 2574922
ෆැක්ස් / தொலைநகல் / Fax 2574880 2574743 2574741

අපේක්ෂාවෙන් වායු සමීකරණ යන්ත්‍රයේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 26ට(26°C) අඩු අගයකට සකස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බලශක්තිය වැය වීම ඉහළ යයි. වායු සමීකරණ යන්ත්‍රයේ උෂ්ණත්ව සීමාව සෙන්ටිග්‍රේඩ් අංශක 1කින් ඉහළ දැමීම මගින් 4%ක විදුලි ඉතිරියක් ලබා කර ගත හැක.

(ඇ) වීදුරු මත කෙළින්ම පතනය වන හිරු රැස් මගින් අධික තාපයක් කාමරය තුළට පැමිණෙන නිසා වායු සමීකරණය කරන ලද කාමරවලට එසේ හිරු රැස් වැටෙන අවස්ථාවල තිරරෙදි (Curtain) මගින් ආවරණය යුතුය.

(ඈ) වායු සමීකරණ යන්ත්‍රවල වායු පෙරණ මනා ලෙස පිරිසිදු කර නඩත්තු කිරීමේ වගකීම ආයතනයේ බලශක්ති කළමනාකරුගේ වගකීමට යටත් කොට අනිවාර්යයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එය අධීක්ෂණය කිරීමට අභ්‍යන්තර යාන්ත්‍රණයක් සකස් කර ගත යුතුය.

(ඉ) පරිසර උෂ්ණත්වය අඩු සෑම අවස්ථාවකදීම ස්වාභාවික වාතාශ්‍රය ප්‍රයෝජනයට ගෙන වායු සමීකරණයන්හි ක්‍රියාකාරීත්වය හැකි පමණ අඩු කරන්න.

(ඊ) කාර්යාලයෙන් පිටවීමට පැය 1/2 කට පමණ පෙර වායු සමීකරණ යන්ත්‍ර/ පද්ධති ක්‍රියා විරහිත කරන්න.

(උ) හැකි සෑම අවස්ථාවකදීම වායු සමීකරණ යන්ත්‍ර වෙනුවට විදුලි පංකා භාවිතා කරන්න. මේස මත තබන විදුලි පංකා (Table Fan) හෝ සිටුවන විදුලි පංකා (Pedestal Fan) සිළිං විදුලි පංකාවලට (Ceiling Fan) වඩා බලශක්ති කාර්යක්ෂමතාවයෙන් ඉහළය.

(ඌ) වායු සමීකරණ මිලදී ගැනීමේදී සෑම විටම (Inverter) සහිත උපකරණ තෝරා ගැනීම කල යුතුය.

(එ) මෙම සමස්ත වැඩපිළිවෙල ඔබ ආයතනයේ බලශක්ති කළමනාකරුගේ වගකීමක් වන අතර, ආයතනයේ බලශක්ති කළමනාකරු මේ සඳහා මෙහෙයවීම සඳහා සියලුම ආයතන ප්‍රධානීන්ගේ ඉහල ප්‍රමුඛතාව හිමි විය යුතුය.

සියළුම රජයේ ආයතන තමන් සතු වායු සමීකරණ සංඛ්‍යාව සහ ඒවායේ කාර්යක්ෂමතාවය පිළිබඳව බලශක්ති විගණනයක් (Energy Audit) සිදු කොට වායු සමීකරණ සඳහා වැය වන විදුලිබලය අඩු කිරීම සිදු කර පසුගිය මාස 06ක කාලය තුල ආයතනයේ සාමාන්‍ය විදුලිබල පරිභෝජනයට සාපේක්ෂව ඉදිරි එක් එක් මාසවල විදුලිය අඩු කිරීමේ ප්‍රගතිය කොළඹ 07, කේම්බ්‍රිජ් පෙදෙස, අංක 04 ස්ථානයෙහි පිහිටි බලශක්ති කළමනාකරණ ලේකම් කාර්යාලය වෙත වාර්තා කල යුතුය. එමෙන්ම මෙම චක්‍රලේඛයේ විධිවිධාන සම්බන්ධව වැඩිදුර තොරතුරු හෝ තාක්ෂණික සහය අවශ්‍ය වන්නේ නම් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පහත නිළධාරියා සම්බන්ධ කර ගත හැක.

නම - හර්ෂ වික්‍රමසිංහ මහතා
තනතුර - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
දුරකථන අංක - 0112677445
0112911713
0712308307
විද්‍යුත් තැපැල - harsha@energy.gov.lk

ආචාර්ය බී.එම්.එස්. බටගොඩ
ලේකම්
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය